සියළුම හිමිකම් ඇවිරිණි]
All Rights Reserved ]

**පාසල් වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සඳහා පැවැත්වෙන විභාගය**

**I පත්‍රය**

**නැණ ලොවට පා තබන හපනුන්ට මඟ කියන**
**"අදිති"**

පැය 01 යි

# පෙරහුරු විභාගය - 02

විභාග අංකය ..............................

**විභාගයට පෙනී සිටින ඔබ සඳහා උපදෙස්**

- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේද ඔබේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 40 ක් ඇත ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම ලියන්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| එකතුව | |
| අවසාන ලකුණ | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමු පරීක්ෂක**<br>ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම් කළ බව සහතික කරමි. | V/I/S |
| **දෙවන පරීක්ෂක**<br>පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි. | V/I/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක**<br>ඇගයීම් කර ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි. | V/I/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක**<br>අධීක්ෂණය කළෙමි.<br>අවසාන ලකුණ නිවැරදිය. | V/I/S/CH |

- **සම්බන්ධතාවය අඩුවෙන් ම පෙන්වන රූප යුගලය ඇති කොටුව තෝරන්න.**

01.



(1)



(2)



(3)

02.



(1)



(2)



(3)

03. දී ඇති උපදෙස් අනුව ඇඳ ඇති චිත්‍රය තෝරන්න.

- හාවෙක් අඳින්න.
- හාවා සමග සමගියෙන් සිටිය හැකි තවත් එක් සතෙක් අඳින්න.
- දෙදෙනාට ම කෑම සඳහා ගත හැකි එක් ආහාරයක් අඳින්න.

(1)



(2)



(3)



04. පහත ඔරලෝසු මුහුණත් අතරින් කාර්මික දෝෂයන් ඇතැයි සිතිය හැකි ඔරලෝසු මුහුණත කුමක් ද?

(1)




(2)




(3)



- **අංක 05 සහ 06 ප්‍රශ්නවල දී ඇති වචනවලට වඩාත් ගැළපෙන රූපය තෝරන්න.**

05. ආරක්ෂාව
පක්ෂී
නිවහන

(1)  (2)  (3) 

06. පලතුරු
එළවළු
C විටමින්

(1)  (2)  (3) 

- **අංක 07 සහ 08 ප්‍රශ්නවල දී ඇති ඒවායින් දෙකක් එක් කාණ්ඩයකටත්, තුනක් තවත් කාණ්ඩයකටත්, වෙන් කළ හැකිය. එම කාණ්ඩ දෙකෙන් එකකටවත් අයත් නො වන්නේ කුමක් ද?**

07. තත්පරය, ලීටර, මිනිත්තුව, ග්‍රෑම්, පැය, මිලිලීටර

(1) ග්‍රෑම් (2) මිලිලීටර (3) තත්පර

08. කැරට්, බීට්, අඹ, වට්ටක්කා, සෝයා, අන්නාසි

(1) බීට් (2) සෝයා (3) අන්නාසි

- **පහත සංඛ්‍යා රටාවල හිස්තැනට ගැළපෙන පිළිතුර තෝරන්න.**

09.

| | |
|---|---|
| 8 | |
| 3 | |
| 4 | 20 |

| | |
|---|---|
| 9 | |
| 5 | |
| 3 | 12 |

| | |
|---|---|
| 7 | |
| 2 | |
| 6 | A |

මෙහි A ට ගැළපෙන සංඛ්‍යාව කීය ද?

(1) 30 (2) 20 (3) 15

10.

| | | |
|---|---|---|
| 7832 | 20 | 2 |
| 3472 | 16 | 7 |
| 9321 | ? | 6 |

'?' ලකුණ දරණ ස්ථානයට ගැළපෙන සංඛ්‍යාව කුමක් ද?

(1) 16 (2) 18 (3) 15

11. ආහාර පිණිස මාංශ කන
දිය ගොඩ දෙකෙහිම සිටින
ගත කළු පාටින් යුතු වන
කුරුල්ලෙක් ය ඒ දනු මැන

(1)  (2)  (3) 

12. වෙළෙන්දෙක් රුපියල් 385.00ක බඩු ගන්නා විට පෑනක් නොමිලේ දෙයි. එක් අයෙකුට පෑන් 9 ක් ලැබුණේ නම්, ඔහු කොපමණ මුදලක බඩු ගෙන තිබේ ද?

(1) රු.3365.00 (2) රු.3465.00 (3) රු.3475.00

13. සමමිතික අක්ෂ දෙකක් හා හතරක් ඇති හැඩතල ඇතුළත් ඝන වස්තු වන්නේ,



(1) ඍජුකෝණාස්‍රය හා සමචතුරස්‍රය
(2) වෘත්තය හා සිලින්ඩරය
(3) ඝනකාභය හා ඝනකය

- **පහත දී ඇති රූප සටහන හොඳින් අධ්‍යයනය කර අංක 14 සහ 15 සඳහා පිළිතුරු සපයන්න.**







14. කසුන්ගේ බර කොපමණ ද?

(1) 35 kg (2) 40 kg (3) 50 kg

15. නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(i) කසුන්ගේ බර නිමල්ගේ බර මෙන් දෙගුණයකට වඩා 10 kg ක් වැඩි ය.

(ii) නිමල්ගේ බර කසුන්ගේ බරෙන් බාගයක් පමණ වේ.

(iii) කසුන්ගේ හා නිමල්ගේ බරෙහි එකතුව නිමල්ගේ බර මෙන් පස් ගුණයකි.

**• කමල් සහ නිමල් එකිනෙකාට 100 m ක් දුරින් සිටිති. කමල් නිමල් දෙසට 20m දුරක් ගොස් තම වම් අත පැත්තට හැරී 10 m ගමන් කර නවතී. නිමල් කමල් දෙසට 30 m ක දුරක් ගොස් තම දකුණු අත පැත්තට හැරී 10 m ගමන් කර නවතී. මෙම විස්තරය අනුව 16 සහ 17 ප්‍රශ්නවලට පිළිතුරු තෝරන්න.**

16. දෙදෙනාගේ ගමන් විස්තරට නිවැරදිව දක්වා ඇති රූපය තෝරන්න.

(1)




(2)




(3)




17. දැන් නිමල් සහ කමල් අතර දුර කොපමණ ද?

(1) 30 m (2) 50 m (3) 70 m

18.

| | | |
|---|---|---|
| අඹ 5 + ඇපල් 3 | —— | රුපියල් 225.00 |
| අඹ 4 + ඇපල් 6 | —— | රුපියල් 270.00 |

ඉහත ඉදිරිපත් කිරීමට අනුව අඹ ගෙඩියක හා ඇපල් ගෙඩියක මිල කීය ද?

(1) රු. 50.00 (2) රු.45.00 (3) රු.55.00

• **පහත ඔරලෝසු මුහුණත් ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු තෝරන්න.**



A නගරයෙන් පිටත් වූ වේලාව



B නගරය පසුකළ වේලාව



C නගරයට ළඟා වූ වේලාව

බස් රථයක් A නගරයේ සිට B නගරය හරහා C නගරයට ගියේය. A නගරයේ ඔරලෝසුවේ වේලාව දක්වෙන්නේ නියමිත වේලාවට වඩා මිනිත්තු 6ක් අඩුවෙන් ය. B නගරයේ ඔරලෝසුවේ වේලාව නියමිත වේලාවට වඩා මිනිත්තු 11 ක් වැඩියෙන් දක්වේ.

19. A නගරයේ සිට B නගරයට යෑම සඳහා ගත වූ කාලය වන්නේ,

(1) මි. 53 (2) පැ.1, මි. 48 (3) මි. 58

20. B නගරයේ සිට C නගරයට ඒමට ගත වූ කාලය පැය 1, මිනිත්තු 4 ක් නම්, ඔරලෝසුවේ නියමිත වේලාව දක්වෙන්නේ කුමන ඔරලෝසුවේ ද?

(1)  (2)  (3) 

21. ධරන් අටවන ශ්‍රේණියේ ඉගෙනුම ලබන විට සීතා දෙවන ශ්‍රේණියේ ද සීතා හය වන ශ්‍රේණියේ ඉගෙනුම් ලබන විට ගීතා පළමු ශ්‍රේණියේ ද ඉගෙනුම් ලැබුවෝ ය. ධරන්ගේ වයස අවුරුදු 28ක් වන විට ගීතාගේ වයස කොපමණ ද?

(1) අවුරුදු 16 (2) අවුරුදු 17 (3) අවුරුදු 18

22. රූපයේ දක්වෙන සෘජුකෝණාස්‍රයේ වටේ දිග 30 cm කි. එහි දිග පැත්ත පළල පැත්ත මෙන් දෙගුණයකි. මෙහි සෘජුකෝණාස්‍රයේ පළල කීයද?



(1) 10 cm (2) 5 cm (3) 15 cm

23. කම්බියක් කැබලි පහකට කැපීම සඳහා මිනිත්තු 20ක් ගගතවෙයි. එම කම්බිය කැබලි තුනකට කැපීම සඳහා ගතවන කාලය කොපමණ ද?

(1) මිනිත්තු 12 (2) මිනිත්තු 10 (3) මිනිත්තු 15

24. වෙළෙන්දෙක් අඹ ගෙඩියක් රුපියල් 10.00 බැගින් අඹ ගෙඩි 600 ක් මිලට ගත්තේය. එයින් අඹ ගෙඩි 400 ක් රුපියල් 15.00 බැගින් ද ඉතිරි අඹ ගෙඩි 200 රුපියල් 12.00 බැගින් ද වික්කේ ය. ඔහු ලැබූ ලාභය කොපමණ ද?

(1) රු.2400.00 (2) රු.2600.00 (3) රු. 2800.00

25. සඳුදා දිනවල සති හයකට වරක් පාසලේ පංතිය පිරිසිදු කිරීමට D කණ්ඩායමට පැවරී ඇත. අද සඳුදා D කණ්ඩායම පංතිය පිරිසිදු කළේ නම් තවත් සති හයකින් සඳුදා දින නැවත එම කණ්ඩායහට පංතිය පිරිසිදු කිරීමට යෙදෙයි. එම සඳුදා දිනය 2024 මාර්තු 23 වන දිනට යෙදේ නම්, අද සඳුදා දිනය කුමක් ද?

(1) පෙබරවාරි 17 (2) පෙබරවාරි 10 (3) පෙබරවාරි 24

26. 1 සිට 9 තෙක් ඉලක්කම් ලියූ කාඩ්පත් 13 ක් තිබේ. මෙම කාඩ්පත්වල 1 සිට 9 තෙක් සෑම ඉලක්කමක් ම ලියා ඇති අතර කිසිම ඉලක්කමක් කාඩ්පත් දෙකකට වඩා ලියා නැත. මෙම කාඩ්පත්වල ලියා ඇති ඉලල්කම් එකතු කළ විට 55 ක් ලැබේ නම් දෙවතාවක් ලියා ඇති ඉලක්කම් විය යුත්තේ මොනවාද?

(1) 3, 4, 5, 6 (2) 1, 2, 3, 4 (3) 2, 3, 4, 5

27. කමනි රු. 46.00 බැගින් පොත් 2 ක්ද, රු. 145.00 බැගින් පැන්සල් පෙට්ටියක් ද, රු.27.00 බැගින් කතුරු 2ක් ද ගෙන වෙළෙන්දාට රු.300.00 දුන් පසු පෑනක් මිලට ගැනීමට තව රු.21.00 ක් අවශ්‍ය විය. පෑනක මිල කීය ද?

(1) රු.25 (2) රු.30 (3) රු.35

28. පහත කුඩා ඝනක වෙන් කළ හැකිය. මෙම ඝනක සියල්ල යොදා ගෙන ඝනකයක් නිර්මාණය කිරීමට අවම වශයෙන් තවත් මෙවැනි කුඩා ඝනක කීයක් අවශ්‍ය ද?



(1) 24 (2) 20 (3) 16

29. වෛද්‍යවරයෙක් උදෑසන 7.00 සිට 8.00 දක්වා රෝගීන් පරීක්ෂා කරයි. ඔහු මිනිත්තු 5 කට රෝගීන් දෙදෙනෙකු පරීක්ෂා කරන අතර පෙ.ව. 7.37 සිට 7.52 දක්වා තේ විවේකය ලබා ගනී. ඔහු පැයක් තුළ පරීක්ෂා කරන රෝගීන් සංඛ්‍යාව කොපමණ ද?

(1) 16 (2) 18 (3) 20

30. මීටර් 80ක් දිග දුම්රියක් තත්පරයක දී මීටර 10ක දුරක් ගමන් කරයි. එම දුම්රියට මීටර 160ක් දිග උමඟක් පසු කිරීමට ගතවන කාලය කෙතෙක් ද?

(1) තත්පර 8 (2) තත්පර 16 (3) තත්පර 24

31. පහත දැක්වෙන සංඛ්‍යා පේළියේ එක් සංඛ්‍යාවක් අනෙක් සංඛ්‍යා සමඟ නොගැළපෙයි. එම සංඛ්‍යාව කුමක් ද?

32642 81928 26853 52734

(1) 81928 (2) 26853 (3) 52734

32. වෛද්‍යවරයෙකු රෝගියෙකුට බෙහෙත් නියම කර ඇත්තේ පෙති පැය 6කට වරක් ද, කරල් පැය 8කට වරක් ද ගන්නා ලෙස ය. සඳුදා පෙරවරු 6.00ට පෙති සහ කරල් එකවර ගන්නා ලදී. නැවත පෙති සහ කරල් එකවර ගන්නා අවස්ථාව වන්නේ,

(1) සඳුදා පස්වරු 6.00ට ය.
(2) සඳුදා මධ්‍යම රාත්‍රී 12.00ට ය.
(3) අඟහරුවාදා පෙරවරු 6.00 ට ය.

33. පහත කවියේ හිස්තැන් සඳහා ගැළපෙන පද ඇතුළත් පිළිතුර තෝරන්න.

දහදිය මුතුවැල් ................දිලෙන්නේ සතුටු සිනාමල් ................පිපෙන්නේ
රටේ දියුණුවයි ................තියෙන්නේ කවි කියමින් ලිය ......... නෙළන්නේ

(1) වතේ, ගතේ, හිතේ, කෙතේ
(2) ගතේ, හිතේ, වතේ, කෙතේ
(3) ගතේ, වතේ, හිතේ, කෙතේ

34. රෝහලක සියලුම රෝගීන්ට දවසේ ආහාර වේල් තුන සඳහා ම ආහාර පාර්සලයක් බැගින් ලබා දෙයි. 17 වෙනි වාට්ටුවේ සිටිය හැකි මුළු රෝගීන් ගණන 52 කි. නමුත් එහි ඇඳන් 24 ක් රෝගීන් නොමැතිව හිස් ව පවතී. අද දින එම වාට්ටුවේ සිටි රෝගීන්ගෙන් 3 දෙනෙක් සුව වී නිවෙස් බලා ගිය අතර තවත් රෝගීන් 17 දෙනෙකු නැවත වාට්ටුවට ඇතුළත් වූයේ නම්, අද දින සඳහා වාට්ටුවට සැපයිය යුතු කෑම පාර්සල් ගණන කීය ද?

(1) 42 (2) 84 (3) 126

35. අමිතා ළඟ සහ දමිතා ළඟ 2025 ජනවාරි මාසයේ තිබූ කෙටිකතා පොත් සහ කවි පොත් ප්‍රමාණය පිළිවෙලින් 12ක් සහ 18 ක් වේ. අමිතා සෑම මාසයකම කෙටිකතා පොත් 3 ක් ද දමිතා සෑම මාසයකම කවි පොත් 2ක් ද මිල දී ගනිති. දෙදෙනා ළඟ තිබෙන කෙටිකතා පොත් සහ කවි පොත් ප්‍රමාණයන් එක සමානවන මාසය වන්නේ.

(1) 2025 ජූනි (2) 2025 ජූලි (3) 2025 අගෝස්තු

- **රූප සටහන ඇසුරින් 36 හා 37 ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුරු තෝරන්න.**




36. පැයට කිලෝමීටර් 4ක වේගයෙන් ගමන් කරන කසුන් A ස්ථානයෙන් පෙ.ව.10.00ට ගමන් ආරම්භ කළේ නම්, B ස්ථානයට ළඟා වන විට වේලාව කීය ද?

(1) මධ්‍යහ්න 12.00 (2) ප.ව.1.00 (3) ප.ව. 2.00

37. පැය දෙකකින් මේ ගමන යාමට නම්, කසුන් පැයකට යා යුතු උපරිම වේගය පැයට කිලෝ මීටර් කීය ද?

(1) 6 km (2) 8 km (3) 4 km

- **අංක 38 සහ 39 ප්‍රශ්නවලට පහත සටහන යොදාගෙන පිළිතුරු සපයන්න.**




පන්තියේ ළමයින් කිහිප දෙනෙකු කැමති ආහාර පිළිබඳ විස්තර මෙම රූප සටහනේ දැක්වේ

38. එක ම කෑම වර්ගයකට පමණක් කැමති අය කී දෙනෙක් මෙහි සිටී ද?

(1) 08 (2) 07 (3) 09

39. පෙ.ව.7.30 ට ඇරඹි ධාවන තරගයක් එක් එක් තරගකරුවන් විසින් අවසන් කරන ලද වේලාවන් මෙසේ ය. මෙම තරගයේ ජයග්‍රාහකයා කවු ද?

| | |
|---|---|
| අමර | පෙ.ව. 7.36 තත්පර 10 |
| නිමල් | පෙ.ව. 7.34 තත්පර 10 |
| සුනිල් | පෙ.ව. 7.35 තත්පර 20 |
| අනිල් | පෙ.ව. 7.34 තත්පර 05 |

(1) නිමල් (2) සුනිල් (3) අනිල්

40. තැටි තරාදියක එක පසකට කිලෝග්‍රෑම් 2 ක පඩියක් දමා අනෙක් පසට පාර්සලයක් දමන ලදී. එවිට පඩිය දැමූ පැත්ත පහළට ගිය අතර නැවත පාර්සලය තිබූ පැත්තට ග්‍රෑම් 200 පඩිය දැමූ විට තැටිය සමබර විය. පාර්සලයේ බර කොපමණ ද?

(1) 2 kg 200 g (2) 1 kg 800 g (3) 2 kg